ලංකා සතොස ලිමිටඩ් සමාගම - 2023

--------------------------------------------

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 වියාචනය කළ මතය

ලංකා සතොස ලිමිටඩ් සමාගමේ ("සමාගම") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.2 මතය වියාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ වියාචනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 හි 32 හා 33 ඡේද අනුව වත්කම් හා වගකීම් හිලව් නොකළ යුතු වුවත් ලැබිය යුතු ගිණුම්වලට අදාල රු.14,115,752 ක් වූ බැර ශේෂ හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් ගිණුම්වලට සිදුකිරීම වෙනුවට ලැබිය යුතු ගිණුම් ශේෂ වලට හිලව්කර දක්වා තිබුණි. | මේ පිළිබඳව වැඩිදුර සැසඳුම් සිදුකෙරෙමින් පවතින අතර ඉදිරියේදී නිවැරදි ගිණුම්කරණ ක්‍රියාමාර්ග ගනු ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශනවල වත්කම් හා වගකීම් වෙන්වෙන්ව දැක්විය යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 හි 54 ඡේදය ප්‍රකාරව අස්පෘශ්‍ය වත්කම් මූල්‍ය ප්‍රකාශනවල වෙනමම හෙළිදරව් කළ යුතු වුවත් රු. 258,110,179 ක් වූ අස්පෘශ්‍ය වත්කම් දේපළ, පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි. | පරිගණක මෘදුකාංග යන පන්තියේ අන්තර්ගත වන්නේ පරිගණක දෘඩාංග පමණක් වන අතර සමාගමේ ක්ෂය ප්‍රතිපත්තිය අනුව නිවැරදිව ක්ෂය කොට ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව අස්පෘශ්‍ය වත්කම් වෙනම හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 02 හි 34 ඡේදය ප්‍රකාරව සියළුම තොග හානි, තොග කපා හැරීම් හා පාඩු ඒවා සිදු වූ කාලපරිච්ඡේදයේ වියදමක් ලෙස හඳුනාගත යුතු වුවද සමාගම විසින් තොග හානි හා තොග ඌනතා ලෙස හඳුනාගත් පිළිවෙලින් රු.43,200,155 ක් සහ රු.106,859,878ක් විකුණුම් පිරිවැයට එකතු කර දක්වා තිබීම හේතුවෙන් විකුණුම් පිරිවැය රු.150,060,033 කින් අධිගණනය වී තිබුණි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 02 හි 34 ඡේදය ප්‍රකාරව විකුණන ලද තොගයට අදාල පිරිවැය ආදායම හඳුනාගන්නා කාලපරිච්ඡේදය තුළදීම හඳුනාගෙන ඇත. එමෙන්ම තොග හානි හා තොග කපා හැරීම් ද අදාළ කාලපරිච්ඡේදය තුළදීම වියදමක් ලෙස හඳුනාගෙන ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව තොග හානි හා තොග කපා හැරීම් වියදම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08 හි 42 ඡේදය අනුව පූර්ව කාලපරිච්ඡේදවලට අදාළ වැරදි අතීතානුයෝගීව මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කර සන්සංදනාත්මක අගයන් නැවත ප්‍රකාශ කළ යුතු වුවද රු.165,242,866 ක් වූ පූර්ව වර්ෂ ගැලපීම් සම්බන්ධයෙන් සන්සංදනාත්මක අගයන් නැවත ප්‍රකාශ කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පූර්ව වර්ෂ වැරදි නිවැරදි කිරීමේදි සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ඵලදායී ජීවිත කාලය සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කළයුතු අතර, වෙනස්කම් ඇතොත්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08 ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් ලෙස ගිණුම්ගත කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයේ සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් එහෙත් තවමත් භාවිතයට ගන්නා පිරිවැය රු.690,055,293 ක් වූ කාණ්ඩ 06 කට අයත් දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තවද දේපල, පිරියත හා උපකරණ කාණ්ඩ 06 කට අදාල වත්කම් අයිතම 2344 ක් අයිතමයක පිරිවැය රු.1 බැගින් එකතුව රු. 2,344 ක් ලෙස සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර වත්කම් ලේඛනයේ හා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීමෙන් 2023 දෙසැම්බර් 31 දිනට වත්කම්වල නිවැරදි වටිනාකම හෙළිදරව් කර නොතිබුණි. | 2025 වසරේ දී නැවත වත්කම් ප්‍රත්‍යාගණනයක් කිරීමට කටයුතු සම්පාදනය කරමින් පවතී. එමගින් මෙම ගැටළුව නිරාකරණය කිරීමට කටයුතු කෙරෙනු ඇත. | සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් එහෙත් තවමත් භාවිතයට ගන්නා වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ධාරණ අගය ගිණුම්වල දැක්වීමට කටයුතු කළ යුතුය. සියලු වත්කම්වල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවු කළ යුතුය. |
| (ඊ) | සමාගමේ අලෙවිසැල්/ගබඩා ආදිය පවත්වාගෙන යාමට බාහිර පාර්ශවයන්ගෙන් බදුකුලී පදනම මත ගොඩනැගිලි 379 ක් ලබාගෙන තිබූ අතර ඊට අදාල ගිවිසුම් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 16 හි 9 ඡේදය ප්‍රකාරව බදුකුලී ගිවිසුම් ලෙස හඳුනාගැනීම වෙනුවට කුලී ගිවිසුම් ලෙස හඳුනාගෙන තිබුණි. තවද අලෙවිසැල්/ගබඩා ආදී ගොඩනැගිලි | ප්‍රමිති ප්‍රකාරව බදු කුලී ලෙස ගිණුම්ගත කළ හැක්කේ එම වත්කම පාලනය කිරීමේ හැකියාව ඇත්නම් පමණි. නමුත් මෙම පරිශ්‍රය පාලනය කිරීම හෝ පාලනය සම්බන්ධයෙන් තීරණ ගැනීමේ අයිතිය ලංකා සතොස සතුව නොමැත. ඒ අනුව මෙය නිවැරදිව කුලී ලෙස ගිණුම්ගත කොට ඇත. | බාහිර පාර්ශවයන්ගෙන් බදුකුලී පදනම මත ලබාගෙන ඇති ගොඩනැගිලි සම්බන්ධයෙන් මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති16 අනුව මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කළ යුතුය. |

බදු ගැනීමේදී ප්‍රමිතියේ 22 ඡේදය ප්‍රකාරව භාවිත අයිතිය ඇති වත්කමක් (right – of- use asset) හා කල්බදු වගකීමක් ලෙස හඳුනා ගැනීම වෙනුවට සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ රු.819,327,408 ක් කුලී වියදමක් ලෙස කාලපරිච්ඡේදයේ ලාභයට ගලපා තිබුණි.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමුපකාර තොග වෙළඳ සංස්ථාවෙන් කුලියට ලබාගෙන ඇති වැලිසර අලෙවිසැල පිහිටි ගොඩනැගිල්ලේ වැඩිදියුණු කිරීම සඳහා සමාගම විසින් වැය කර තිබූ රු. 96,913,945 ක් ලැබිය යුතු ශේෂයක් ලෙස හෝ වියදමක් ලෙස දැක්වීම වෙනුවට දේපල, පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි. | 2023 සැප්තැම්බර් මස මෙම ආයතනය ඇවර කර එම වත්කම් ලංකා සතොස භුක්තිය සඳහා ලබා දී ඇති අතර ඉදිරියේදී එහි අයිතිය ලංකා සතොස වෙත පැවරෙනු ඇත. | වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | විකුණුම් පිරිවැය ගණනය කිරීමේදී සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මාර්ගස්ථ තොග ගිණුමේ පැවති රු.9,145,626 ක බැර ශේෂය අඩුකර දක්වා තිබීම, Default Batch Transfer සහ Default Batch Clearance යන ගිණුම්වල පැවති එකතුව රු.35,704,903 ක බැර ශේෂ තොග අඩුමාන ලෙස නොදක්වා විකුණුම් පිරිවැයට ගැලපීම, තොග ගැලපුම් ගිණුමේ රු. 18,585,459 ක ශේෂය විකුණුම් පිරිවැයෙන් අඩු කර දක්වා තිබීම, විකුණුම් පිරිවැයට ගැලපිය යුතු නොවන එකතුව රු.39,500,596 ක් වූ ශේෂ විකුණුම් පිරිවැයෙන් අඩුකර දක්වා තිබීම සහ පෙර වර්ෂවල මිලදීගත් තොගයෙන් සැපයුම්කරුවන්ට ආපසු යැවූම් රු. 912,102 ක් තොග ගිණුමට බැර කිරීම වෙනුවට විකුණුම් පිරිවැයෙන් අඩුකර දක්වා තිබීම යන හේතු මත සමාලෝචිත වර්ෂයේ විකුණුම් පිරිවැය රු.103,848,686 කින් ඌන ගණනය වී තිබුණි. | මෙම ගැටළුව හඳුනාගෙන 2024 වාර්ෂික ගිණුම් තුළින් නිරාකරණය කරනු ඇත. | විකුණුම් පිරිවැය නිවැරදිව ගණනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකරන ලද තැන්පතු ගිණුමේ පැවති රු.1,168,620 ක හඳුනානොගත් සෘජු තැන්පතු හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂය තුළදී මෙම සෘජු තැන්පතු හඳුනාගැනීම සඳහා සාක්ෂි ලබා ගැනීමට නොහැකි විය. | මුදල් ප්‍රේෂණය කළ පාර්ශවයන් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයහිමියන් විසින් තහවුරු කරන ලද ණය ශේෂ හා ලෙජරයේ ශේෂ සැසඳීමේදී රු. 249,206,844 කින් ලෙජරයේ ශේෂවලට වඩා ණයහිමියන් විසින් තහවුරු කරන ලද ශේෂ වැඩිවීමක් ද, රු.111,882,873 කින් ලෙජරයේ ශේෂවලට වඩා ණයහිමියන් තහවුරු කළ ශේෂ අඩු වීමක් ද නිරීක්ෂණය විය. | 2023.12.31 දින වන විට නිෂ්කාශනය නොවූ චෙක්පත් පැවතීමත්, වර්ෂ අවසානයේ එවන ලද භාණ්ඩ ඒ වන විට නොලැබීමත්, භාණ්ඩ ආපසු හරවා යැවුම් පැවතීමත් මෙම වෙනසට හේතු වශයෙන් පෙන්වා දිය හැක. | ණයහිමි ලෙජර ශේෂ හා ශේෂ තහවුරු කිරීම් සසඳා අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාගම විසින් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබාගත් එකතුව රු.335,120,765 ක් වටිනා උපකරණ, නාම පුවරු, ගෘහ භාණ්ඩ හා සවිකිරීම්වලට අදාල කල්බදු ගිවිසුම් 10 ක නියැදියක් පරීක්ෂාවේදී මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබූ කල්බදු ණයහිමි වටිනාකම රු.80,446,553 ක් හා ගිවිසුම්වල සඳහන් කල්බදු ණයහිමි වටිනාකම රු.116,678,625 ක් වීමෙන් රු. 36,232,072 ක වෙනසක් විය. | ගිවිසුමේ සඳහන් වටිනාකමට වඩා අඩු අගයක් ගෙවනු ලබන්නේ, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දුන් තිරණයකට අනුවය. එම අඩු වටිනාකම පිළිබඳව අදාළ සැපයුම්කරුවන් වෙත දන්වා ඇත. | කල්බදු වත්කම් සහ කල්බදු වගකීම් ශේෂ සැසඳීම් කර නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | දේපල, පිරියත හා උපකරණ පිරිවැය | 3,976,321,552 | 3,576,124,612 | 400,196,940 | සිදුකිරීමට නියමිත ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය මගින් මෙම ගැටළුව නිරාකරණය කෙරෙනු ඇත. | ගිණුම් ශේෂ අනුරූපී වාර්තා සමග සසඳා මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ආ) | වාර්ෂික ක්ෂය | 474,675,403 | 357,033,733 | 117,641,670 | සිදුකිරීමට නියමිත ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය මගින් මෙම ගැටළුව නිරාකරණය කෙරෙනු ඇත. | -එම- |
| (ඇ) | අස්පෘශ්‍ය වත්කම් පිරිවැය | 306,875,996 | 240,006,000 | 66,869,996 | අස්පෘශ්‍ය වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කිරීම සිදු කරනු ලැබුවේ 2021 වර්ෂයේ සිට වන අතර, ඒ වන තෙක් මෘදුකාංග යටතේ ඇතුලත් කර ජර්නල් සටහනක් මගින් අස්පෘශ්‍ය වත්කම් ගිණුමට මාරු කර ඇත. | -එම- |
| (ඈ) | අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | 63,274,249 | 59,221,016 | 4,053,233 | සිදුකිරීමට නියමිත ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය මගින් මෙම ගැටළුව නිරාකරණය කෙරෙනු ඇත. | -එම- |
| (ඉ) | වෙළඳ තොගය | 8,037,622,194 | 7,479,538,061 | 558,084,133 | 2023 ගිණුම් වර්ෂයට අදාල 2024 ජනවාරි මස සිදු කළ තොග ගණනය එක් එක් දිනවල සිදු කර ඇති අතර 2023.12.31 | වෙළඳ තොගය වර්ෂය අවසාන දිනට භෞතිකව පරීක්ෂා කර බලා මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් කළ යුතුය. |

| | | |
|---|---|---|
| | | දිනට පරිගණක පද්ධතිය හරහා stock roll back ක්‍රියාවලිය මඟින් නිවැරදි තොගය පරිගණක පද්ධතිය හරහා හුවමාරු විය යුතු නමුත් දැනට පවතින පරිගණක පද්ධතිය තුළ එවැනි පහසුකම් සලසා නොමැත. |

### 1.5.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළ නිලධාරීන් 10 දෙනෙකුට අන්තර් දීමනා ලෙස රු.2,500,000 ක් හා ප්‍රධාන විධායක නිලධාරිට සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් 05 දෙනෙකුට මසකට රු.75,000 බැගින් එකතුව රු.3,292,500 ක් කාර්යයසාධන දීමනා ලෙස ගෙවා තිබුණි. | තොරතුරු තාක්ෂණ අංශයේ නිලධාරීන් 10 දෙනකු සඳහා අන්තර් දීමනා ලෙසද, ප්‍රධාන විධායක නිලධාරී සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන් 05 දෙනාට කාර්යසාධන දීමනා ලෙසද ගෙවා ඇති මුදල් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව ගෙවා ඇත. | භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමෙන් පසු අන්තර් දීමනා හා කාර්යසාධන දීමනා ගෙවීමට කටයුතුකළ යුතුය. අනුමැතිය රහිතව කළ ගෙවීමක් නම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.5 සමාගමේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් ආසන්න වර්ෂ 5 ක් තුළ සමාගම රු.35,424,509 සිට රු.3,158,544,037 ක් දක්වා වූ පරාසයකින් අඛණ්ඩව මෙහෙයුම් කටයුතු වලින් ඌනතාවයන් | සෘණ ස්කන්ධ ප්‍රාග්ධන වටිනාකම විශ්ලේෂණය කිරීමේදී රජයේ තීරණය මත 2014/15 වර්ෂ වලදී සහල් ආනයනය නිසා සිදු වූ රු.බිලියන 6.8 ක පාඩුව (වාර්තා | කළමනාකාරිත්වය විසින් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව අවධානයක් යොමු කර මෙහෙයුම් කටයුතුවල |

| | | |
|---|---|---|
| වාර්තා කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා ඌනතාවය රු.695,233,136 ක් විය. තවද සමාලෝචිත වර්ෂය අවසානයේ සමාගමේ මුළු වත්කම් වටිනාකම රු.11,663,026,809 ක් වූ අතර මුළු වගකීම් වටිනාකම රු. 22,746,261,338 කි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ වත්කම් ඉක්මවා රු.11,083,234,529 ක වගකීම් ප්‍රමාණයක් තිබීම සමාගමේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය. | අනුව) මේ තුල අන්තර්ගත වන අතර එමගින් මෙම අලාභය තවත් තීව්‍ර වී ඇත. ඒ අනුව ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව උද්ගතව ඇති ප්‍රශ්නය නිරාකරණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරනු ලබන මහා භාණ්ඩාගාර නියෝජිතයන්ගේ යෝජනාව පරිදි අති විශේෂ මහා සභා රැස්වීමක් (EGM) කැඳවා ඇත. එහි මූලික අරමුණ ආයතනයේ අඛණ්ඩ පැවැත්ම වෙනුවෙන් ප්‍රාග්ධන ආයෝජන (Equity Infusion)ලබා ගැනීම වේ. | වර්ධනයක් ඇතිකර ගැනීම සඳහා සුදුසු උපක්‍රම භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 08කට අදාලව වටිනාකම රු.579,723,727 ක් සඳහා විස්තරාත්මක උප ලේඛන ද, වටිනාකම රු.83,392,226 ක් වූ තොග සඳහා තොග සත්‍යාපන වාර්තා, වටිනාකම රු.1,503,112,724 ක් සඳහා ශේෂ සනාථ කිරීමේ ලිපි සහ වටිනාකම රු.17,622,322 සඳහා කාල විශ්ලේෂණ යනාදී විගණන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය. | දීර්ඝ කාලයක් තිස්සේ පැවත එන ශේෂයන් සඳහා විස්තරාත්මක උප ලේඛනයක් හෝ ලිඛිත සාක්ෂි ලබාගත නොහැක. රඳවාගැනීමේ බදු, කුලී තැන්පතු හා වෙළඳ ණයගැතියන් සඳහා අපහායන වෙන් කිරීම සම්බන්ධයෙන් උපලේඛන හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ගිණුම් ඉදිරිපත් කිරීමේ දී ලබා දී ඇත. අලෙවිසැල්වල පැවති අතැති මුදල් හා Credit Card Control ගිණුම පිළිබඳ උපලේඛන 2024 වර්ෂයේ සිට ලබා දීමට කටයුතු කරනු ලැබේ. තෑගි වවුචර් විකිණීමේ දී අදාල පාර්ශවය සටහන් නොකරන අතර වවුචර්වල කේතයන් පමණක් උපලේඛනගත කරයි. 2023.12.31 දිනට පරිභෝජන තොගය සත්‍යාපනයක් සිදු කොට නොමැති අතර ණය ගැති ශේෂ සනාථ කිරීමේ ලිපි සඳහා පිළිතුරු ලබා දී නොමැත | ශේෂයන් තහවුරු කර ගැනීමට අදාල උපලේඛන පවත්වා ගැනීමට හා විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2015 වර්ෂයේ සිට අලෙවිසැල් සහ ගබඩා 07 ක් වෙනුවෙන් ගෙවිය යුතු කුලී වටිනාකම වූ රු.7,544,233 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2015 වර්ෂයේ සිට ගබඩා හතක් වෙනුවෙන් ගෙවිය යුතු කුලී වටිනාකම වූ රු.7,544,233 ඉදිරියේ දී ගෙවීම් කිරීමට කටයුතු කරනු ඇත. | ගිවිසුම්ගත වියදම් නොපමාව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 8(2)(අ)(ii) වගන්තිය හා 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 16(i) වගන්තිය | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමාගමේ අලෙවිසැල්වල සේවය කරනු ලැබූ දෛනික වැටුප් ගෙවන සේවකයින් 573 දෙනෙකු සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා ලියාපදිංචි කර දායක මුදල් ගෙවා නොතිබුණි. | මෙම ගැටළුව මග හරවා ගැනීම සඳහා දෛනික කම්කරුවන් ආයතනික වශයෙන් ටෙන්ඩර් පටිපාටිය හරහා තෝරා ගැනීම සිදු කරනු ලබයි | දෛනික වැටුප් ගෙවන සේවකයින් සේවක අර්ථසාධක හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා ලියාපදිංචි කර දායක මුදල් ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2007 අංක 07 දරන සමාගම් පනතේ 133 වන වගන්තිය | 2021 හා 2022 වර්ෂ සඳහා වාර්ෂික මහා සභා රැස්වීම් 2025 ජුලි 31 දක්වා පවත්වා නොතිබුණි. | ඉදිරියේදී නිසි පරිදි මහා සභා රැස්වීම් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. | සමාගම් පනත ප්‍රකාරව වාර්ෂික මහා සභා රුස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතෙහි 5(I) වගන්තිය | 2019 සිට 2023 දක්වා කාලපරිච්ඡේදය තුළ සේවයෙන් ඉවත් වූ පාරිතෝෂික සඳහා හිමිකම් ලබන සේවකයින් 243 දෙනෙකු සඳහා ගෙවිය යුතු රු.51,052,620 ක් වූ පාරිතෝෂික දීමනා 2025 ජුලි 31 දින වන විටත් ගෙවා නොතිබුණි. | කම්කරු දෙපාර්තමේන්තු නියෝගය පරිදි අදාළ පාරිතෝෂික මුදල් හා අධිභාරය වාරික වශයෙන් සේවයෙන් ඉවත් වූ පිළිවෙලට ගෙවීම් කිරීමට ඇතිතරගත් එකගතාවය මත 2025.08.13 වන දින පළමු රු.මිලියන 4.1 | පාරිතෝෂික ගෙවීම් නියමිත දිනයන්හි දී ගෙවීම් කිරීම තුළින් දඩ මුදල් ගෙවීම වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | සේවකයන් 21 දෙනෙකු සඳහා නිදහස් කරන ලදී. | |
| (ඈ) | 2022 නොවැම්බර් 21 දිනැති අංක පීඊඩී 08/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් අරමුදල් ලබාගන්නේ නම් සේවකයින් සඳහා ඉතිරිකරගත් නිවාඩු මත දීමනා ගෙවීම නොකළ යුතු වුවද ඊට පටහැනිව සමාගම විසින් සේවකයින්ගේ ඉතිරි කරගත් නිවාඩු මත දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.14,119,773 ක් ගෙවා තිබුණි. | 2023 වසර සඳහා ඉතිරි කර ගත් නිවාඩු සඳහා ගෙවීම් කිරීමේදී අධ්‍යාක්ෂ මණ්ඩල තීරණයට යටත්ව කටයුතු කර ඇත | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධානවලට පටහැනි ලෙස සිදුකළ ගෙවීම් ආපසු අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක. 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙන් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යවසායකයන්ගේ සංයුක්ත පාලනය සඳහා වු මාර්ගෝපදේශයේ 4.3 ඡේදය | 2023 අප්‍රේල් 04 දිනෙන් පසු අවදානම් කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | අභ්‍යන්තර විගණන අංශයේ කාර්යයන් සමඟ අවදානම් පදනම් කරගත් ප්‍රවේශයක් අනුගමනය කරනු ලබන අතර තවදුරටත් ශක්තිමත් කිරීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. | චක්‍රලේඛ විධිවිධානවලට අනුව අවදානම් කමිටු පැවැත්වීමට හා එමගින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙන් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යාපාර සඳහා වු මෙහෙයුම් අත්පොත | | | |
| | (i)3.2 (V) ඡේදය | සමාගම විසින් ක්‍රියාත්මක කරන දිරිගැන්වීමේ යෝජනා ක්‍රමය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. ඒ අනුව අනුමැතියෙන් තොරව කාර්ය මණ්ඩලයට රු.28,096,000 ක් දිරි දීමනා ලෙස ගෙවා තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | දිරිගැන්වීමේ යෝජනා ක්‍රමය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමෙන් පසු ගෙවීම් කළ යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) 3.5 ඡේදය | අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව සමාගමේ නිලධාරිනියක් 2022 මැයි 23 දින සිට තාවකාලිකව රේඛීය අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර තිබූ අතර එදින සිට විගණිත දිනය වූ 2024 මාර්තු 31 දින දක්වා වැටුප් හා දීමනා ලෙස රු.2,536,254 ක් ගෙවා තිබුණු අතර එම මුදල අමාත්‍යාංශයෙන් අයකරගෙන නොතිබුණි. | වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතා අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) ගේ 2022.05.23 දිනැති ලිපිය මගින් ලංකා සතොස ආයතනයේ අත්‍යවශ්‍ය හා හදිසි කටයුතු අමාත්‍යාංශය සහ සම්බන්ධීකරණය කිරීම සඳහා එම නිලධාරිනිය අනියුක්ත කිරීම දැනුම් දී ඇත. | චක්‍රලේඛ විධිවිධානවලට අනුව කටයුතු කළයුතු අතර ගෙවූ වැටුප් හා වේතන ආපසු අයකරගත යුතුය. |
| | (iii) 6.6 ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා සකස් කළ මූල්‍ය ප්‍රකාශන අවුරුදු 2 දින 40 ක ප්‍රමාදයකින් පසු 2025 අප්‍රේල් 09 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | 2025 වර්ෂය සඳහා වන ගිණුම් නියමිත කාල වකවානුව තුල ලබාදීමට කටයුතු කරනු ඇත. | නියමිත දිනට ගිණුම් විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | 2022 ජනවාරි 18 දිනැති අංක 02/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | මාසික දුරකථන දීමනා සඳහා හිමිකම් නොලබන සමාගමේ නිලධාරීන් 77 දෙනෙකු සඳහා රු.786,645 ක මුදලක් දුරකථන දීමනා ලෙස ගෙවා තිබුණි. | 2022 ජනවාරි 18 දිනැති අංක 02/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව කටයුතු කර ඇති අතර එහි අංක 02 යටතේ ඇති නිලධාරීන්ගේ වැටුප් කාණ්ඩය අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව අනෙකුත් විධායක ශ්‍රේණියේ නිලධාරීන් හට දුරකථන දීමනා ගෙවා ඇත. | චක්‍රලේඛ විධිවිධානවලට අනුව හිමිකම් ලබන නිලධාරීන්ට පමණක් දුරකතන දීමනා ගෙවිය යුතු අතර චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව ගෙවූ දුරකථන දීමනා අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 6.1, 6.2 හා 6.4 ඡේද | චක්‍රලේඛය ප්‍රකාරව උපදේශක වැනි සේවාවක් දින 90 ක් නොඉක්මවන කෙටිකාලීන පදනමක් මත හදිසි සේවයක් ලෙස ලබාගතයුතු අතර රු.150,000 ක් වූ උපරිම දීමනාවක් අදාල කාර්යය නිම වූ පසු අමාත්‍යාංශ ලේකම්ගේ පෞද්ගලික අනුමැතිය මත ගෙවිය යුතු වුවද ඊට පටහැනිව | | |

| | | |
|---|---|---|
| (i) සමාගමේ රටබීම අලෙවිසැල් සඳහා බලපත්‍ර ලබාගැනීම වෙනුවෙන් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව හා චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව උපදේශකයෙකු පත් කර 2022 ජූනි සිට 2024 මැයි දක්වා රු.3,496,789 ක මුදලක් ගෙවා තිබුණි. | 2021.04.20 වන දින පැවති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මත්පැන් බලපත්‍ර 100 ක් ලබා ගැනීමට අදාලව කැබිනට් අනුමැතිය මත ඒ වන විටත් මත්පැන් බලපත්‍ර ලබා ගැනීමේ කාර්යය සිදුවෙමින් පැවතිය ද එම කාර්යය වඩා කාර්යක්ෂමව සහ අවම වියදමක් යටතේ සිදු කිරීම මූලික අරමුණු කර ගෙන ආයතනය තුළ ඒ හා සම්බන්ධව දැනුම සහිත සුදුසු පුද්ගලයකු නොමැති වූ බැවින් අමාත්‍යාංශ උපදෙස් මත ඒ සම්බන්ධව දැනුම ඇති හිටපු සතොස සාමාන්‍යාධිකාරී, හිටපු සභාපති සහ හිටපු ප්‍රධාන විධායක නිලධාරී අනුමැතීන් මත උපදේශක තනතුරක් යටතේ පත්කිරීමට කටයුතු කරන ලදි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව උපදේශක තනතුරු සඳහා බඳවා ගැනීමේදී භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට හා ඒ අනුව ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) 2022 සැප්තැම්බර් 01 දින සිට මාස 06 ක කාලසීමාවකට කොන්ත්‍රාත් පදනමට බඳවා ගෙන තිබූ නීති නිලධාරිනියගේ සේවා කාලය 2022 මාර්තු 22 දින සිට 2023 අගෝස්තු 30 දින දක්වාත් නැවත 2023 සැප්තැම්බර් 01 දින සිට 2024 පෙබරවාරි 29 දක්වාත් වශයෙන් වර්ෂ 1 මාස 06 ක් දක්වා දීර්ඝ කර තිබුණි. නිලධාරිනියට උපදේශන ගාස්තු ලෙස චක්‍රලේඛයට පටහැනිව රු.2,092,500 ක් ගෙවා තිබුණි. | මෙම තනතුර අනුමත කාර්ය මණ්ඩලයෙහි නොමැති තනතුරක් හේතුවෙන් ආයතනයේ අවශ්‍යතාවය මත මෙම නිළධාරී මහත්මිය කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති අතර අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත ගෙවීම් සිදු කර ඇත. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව විශේෂ තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනමට බඳවා ගැනීමේදී භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (එ) | 2017 මැයි 16 දිනැති අංක DMS/1741 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් සඳහා අනුමත මාසික දීමනාව පිළිවෙළින් රු. 95,000 ක් සහ රු.90,000 ක් වුවද අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ප්‍රධාන විධායක නිලධාරීට රු.250,000 ක හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් 5 දෙනෙකුට රු.150,000 බැගින් මාසික දීමනාවක් ගෙවා තිබුණි. ඒ අනුව 2023 වර්ෂයේදී ප්‍රධාන විධායක නිලධාරීට සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්ට වැඩිපුර ගෙවා තිබූ මුදල පිළිවෙලින් රු.1,860,000 ක් හා රු.2,094,400 ක් විය. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව ගෙවීම් කරනු ලැබේ. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කර ඇති ගෙවීම් ප්‍රමාණය ඉක්මවා ගෙවීම් කිරීමේදී භාණ්ඩාගාර පූර්ව අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුය. අනුමැතිය රහිතව සිදුකළ ගෙවීම් ආපසු අයකරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඒ) | 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | රාජකාරී හා පෞද්ගලික පරිහරණය සඳහා නිල වාහන භාවිතා කිරීම හෝ නිල වාහන භාවිතා කිරීම වෙනුවට ප්‍රවාහන දීමනාව ලබා ගැනීමට හිමිකමක් නොමැති MM 1-1 ශ්‍රේණියේ තනතුරු දරන නිලධාරීන් 19 දෙනකුට 2023 වර්ෂය තුලදී ප්‍රවාහන දීමනා ලෙස රු.2.807,083 ක් ගෙවා තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් පමණක් අදාළ ගෙවීම් සිදු කර ඇත. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමු කර ඇති අතර, මේ වන තෙක් එහි අනුමැතිය ලැබී නොමැත | චක්‍රලේඛය පරිදි හිමිකම් නොමැති නිලධාරීන්ට ගෙවීම් කිරීමේදී භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතුය. අනුමැතිය රහිත ගෙවීම් ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.695,233,136 ක පාඩුවක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු.35,424,509 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.659,808,627 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වෙනත් ආදායම් රු. 192,517,648 කින් වැඩි වී විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් රු. 539,402,823 කින් අඩු වී තිබුණද අඩමාණ ණය, තොග හානි ආපසු අය කරගැනීම්, තොග ආපසු යැවුම් හා ණයහිමි හර ශේෂ සඳහා එකතුව රු.849,869,028 ක වෙන් කිරීම් සිදු කිරීම, පරිපාලන වියදම් රු.213,057,712 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 වසරේ සිට 2021 වසර දක්වා ක්‍රියාත්මක වූ ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය සඳහා වැඩ අවසන් කිරීමේ වාර්තාවකින් තොරව, කොන්ත්‍රාත්කරුට රු.83,000,000 ක් ගෙවා කොන්ත්‍රාත්තුව අවසන් කර තිබූ අතර කොන්ත්‍රාත්තුව නොදන්වා අවසන් කිරීම සම්බන්ධයෙන් අදාල කොන්ත්‍රාත්කරු විසින් සමාගමට විරුද්ධව ගොනු කර ඇති නඩුව සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු.7,656,904 ක මුදලක් නඩු ගාස්තු ලෙස වැයකර තිබුණි. 2021 වර්ෂයේදී සමාගමේ ඒකාබද්ධ ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය (ERP system) පුළුල් කිරීම සඳහා පුද්ගලික ආයතනයක් තෝරාගෙන රු.මිලියන 201 ක් වැයකර තිබුණි. මෙම ප්‍රසම්පාදන කාර්යයට අදාලව ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබූ අතර ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් කිරීමේදී ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනයේ (ICTA) අවසාන පද්ධති විගණනය සහ පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණය විගණිත දිනය වූ 2025 අගෝස්තු 31 දින වන විටත් සිදුකර නොතිබුණි. | මෙම නඩුවට අදාළව රු.112,941,954 ක මුදලක් අය කර ගැනීමට බේරුම්කරණ මධ්‍යස්ථානයේ නඩුවක් ගොනු කර ඇත. එම නඩුව දැනට විභාග වෙමින් පවතින අතර බේරුම්කරණ මධ්‍යස්ථානයේ වර්තමාන සභාපති ඉල්ලා අස්වී ඇති අතර, නව සභාපතිවරයකු පත් වූ වහාම නඩුව කැඳවීමට නියමිතය. | සමාගමට ගැලපෙන පද්ධතියක් මනා සැලසුමකින් හා ශක්‍යතා අධ්‍යනයකින් පසුව තෝරා ගෙන ස්ථාපිතකර ගැනීමට කටයුතු කළ යුතුය.<br>සිදුව ඇති අලාභය වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාගම විසින් රු. 230,269,715 ක් වැය කර කරච්චි ප්‍රාදේශීය සභාවට අයත්ව තිබූ කිළිනොච්චි ප්‍රදේශයේ ඉඩමක ගොඩනැගිල්ලක් ඉදි කර තිබූ අතර එය එම ප්‍රාදේශීය සභාව විසින් 2014 නොවැම්බර් 19 දින වෙළඳ අමාත්‍යාංශයට පවරා දී තිබුණි. ඉහත පරිදි ඉදිකිරීම් සිදු කළද අදාළ ඉඩමේ අයිතිය පවරා ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි. | මෙම ගොඩනැගිලිවල ඉදිකිරීම සඳහා ගෙවන ලද මුදල ප්‍රාග්ධනිත කර ඇත්තේ මෙම දරණ ලද වියදම තුලින් අනාගත ප්‍රතිලාභ ආයතනය තුලට ගලා ඒම නිසා සහ එහි නෛතික අයිතිය ලංකා සතොස වෙත පැවරෙනු ඇතැයි යන හේතුව නිසාවෙනි. දැනට මෙහි අයිතිය ලංකා සතොස වෙත පැවරීම සඳහා අදාළ සියලු කටයුතු සිදු කොට ඇත. | ඉඩමේ අයිතිය නොපමාව සමාගමට පවරා ගැනීමට කටයුතු කළ යුතුය |
| (ඇ) | ශ්‍රී ලංකා රජයෙන් පනවන ලද ආනයන පාලන සීමාවන්ට පටහැනි ලෙස දේශීය සැපයුම්කරුවන් දෙදෙනකු විසින් 2021 ජුනි 21 දින ආනයන කරන ලද සිනි මෙට්‍රික් ටොන් 2,269.5ක් පරිභෝජනයට නුසුදුසු මට්ටක පැවතියදීත් ප්‍රසම්පාදන | 2022.11.01 දිනැති අංක 22/1753/627/021 දරන කැබිනට් පත්‍රිකාවට අනුව සැපයුම්කරුවන්ගෙන් සීනි තොගය මිලදී ගැනීමට අනුමැතිය ලබා දී ඇති අතර සීනි තොගය | පරිභෝජනයට නුසුදුසු හානිදායක වන නිෂ්පාදන මිලදී ගැනීම හෝ අලෙවි කිරීම සිදු නොකළ යුතුය. |

| | | |
|---|---|---|
| ක්‍රමවේදය අනුගමනය කිරීමකින් තොරව 2022 දෙසැම්බර් 18 දින රු.මිලියන 389.8 ක් වැයකර සමාගම විසින් මිලදිගෙන දේශීය රසකැවිලි නිෂ්පාදකයන්ට අලෙවිකර තිබුණි. | නැවත රසකැවිලි සමාගම් 5කට අලෙවි කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. | |

## 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය අනුව අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් ද සමාගමේ වෙළඳ තොගය සපයා ගැනීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් ද පිළියෙල කර නොතිබුණි. | 2025 වර්ෂය සඳහා මෙය පිළියෙළ කොට ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව ප්‍රසම්පාදන සැලසුම් සකස් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | විකුණුම් ප්‍රවර්ධන වැඩසටහනක් වෙනුවෙන් තෑගි ලබාදීමට සහ ආයතනයේ සේවකයන්ට ලබාදීම සඳහා රු.5,112,850 ක් වැයකර ජංගම දුරකථන 315 ක් මිලදී ගැනීමේ හා රු.2,354,000 ක මුදලකට ලැප්ටොප් 15 ක් මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1(අ), 2.3.2(ඇ), 5.3.11, 5.4.8 හා 8.9.1 මාර්ගෝපදේශවලට පටහැනිව ක්‍රියාකර තිබුණි. | ප්‍රසම්පාදනය සඳහා සිදු කරන ලැබූ ඉල්ලීමත් සමඟ ඇස්තමේන්තුවක් ලබාදී ඇති අතර මෙම ප්‍රසම්පාදනය සඳහා ඉල්ලීම සිදුකරනු ලබන්නේ අවශ්‍යතාවය ඇති අංශයේ තාක්ෂණික දැනුම සහිත නිලධාරියකු විසින් තහවුරු කරන ලද පිරිවිතරයන් සහිතව ප්‍රධාන විධායක නිලධාරීගේ අනුමැතිය සහිතව වේ. මෙම ප්‍රසම්පාදනය සඳහා කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹී නොමැති අතර ලංසු සුරක්ෂණ හෝ කාර්යසාධන සුරක්ෂණ ලබාගැනීමක් සිදුකර නොමැත. | ප්‍රසම්පාදන ක්‍රියාකාරකම්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කරමින් සිදු කළ යුතුය. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද තනතුරු 20 කට අදාලව පුරප්පාඩු 852 ක් පැවති අතර විකුණුම් සහායක තනතුරේ 281 ක සේවක අතිරික්තයක් පැවති අතර මෙම අතිරික්ත සේවකයින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව බඳවාගෙන තිබුණි. සමාගමේ අලෙවිසැල් සඳහා 3,836 ක කාර්යය මණ්ඩලයක් අනුමතකර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වනවිට අලෙවිසැල් කළමනාකරු, සහකාර අලෙවිසැල් කළමනාකරු, ජ්‍යෙෂ්ඨ විකුණුම් සහායක සහ ගබඩා සහායක යන තනතුරු 4 ට අදාලව පුරප්පාඩු 726 ක් පැවතුණි. | සාප්පු කාර්යභාර නිළධාරී තනතුර සඳහා තෝරාගත් අයදුම්කරුවන් 07 දෙනෙකු අතරින් 02 දෙනකු පමණක් සේවයට වාර්තා කර ඇත. අලෙවිසැල් කළමනාකරුවන්ට උපාධි සුදුසුකමක් නොමැතිවීම හේතුවෙන් සේවා පළපුරුද්ද හා කාර්යසාධනය පදනම් කර ගනිමින් සහකාර සාප්පු කාර්යභාර නිළධාරී තනතුර සඳහා වැඩ බලන තනතුරට පත් කර වැඩබලන දීමනාවක් 2023.01.01 දින සිට ගෙවනු ලබයි. | සමස්ථ කාර්යමණ්ඩලය සම්බන්ධයෙන් සමාලෝචනයක් සිදු කර සමාගමේ අවශ්‍යතාවයට ගැලපෙන කාර්යමණ්ඩලයක් ස්ථාපිත කර අනුමත කරවාගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානය තුලදී සමාගම විසින් සේවකයින් 573 දෙනෙකු දෛනික වැටුප් ගෙවීමේ පදනම මත අලෙවිසැල් සඳහා බඳවාගෙන තිබුණි. ඔවුන්ගේ පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රයක් මඟින් සටහන් කර නොතිබූ අතර අත්සන් ලේඛනයක් මත පදනම්ව රු.349,041,862 ක් දෛනික වැටුප් ලෙස ගෙවා තිබුණි. | දෛනික ගෙවීම් ක්‍රමය යටතේ අනියම් පදනමට සේවකයන් බඳවාගෙන නොමැති අතර දෛනික සේවා අවශ්‍යතාව මත දෛනින ගෙවීම් පදනම මත කම්කරුවන් යොදවා ගැනිම සිදුකර ඇත. සමහර කම්කරුවන් අඛණ්ඩව සේවයේ යෙදී නොසිටීම හේතුවෙන් ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් පහසුකම් සලකා නොමැත. අදාල අත්සන් ලේඛනය අලෙවිසැල් කළමනාකරු විසින් නිවැරදි බවට සහතික කර කලාප කළමනාකරු මඟින් ගෙවීම් සඳහා ඉදිරිපත් කරනු ලබයි. | දෛනික වැටුප් ගෙවීමේ පදනම මත බඳවාගත් සේවකයින්ගේ පැමිණීම සහ පිටවීම සටහන් කිරීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |
| (ඇ) | අලෙවිකරණ හා මාර්ගගත වෙළඳාම් පිළිබඳ ප්‍රධානි (Head of Marketing & Online Trading) සහ රහස්‍ය ලේකම් යන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු දෙක සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව නිලධාරීන් | කළමනාකාරීත්ව තීරණයක් මත, ඒ වන විට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) තනතුර සඳහා බඳවා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සේවක මණ්ඩලය පමණක් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. වෙනත් අවශ්‍යතා |

| | | |
|---|---|---|
| දෙදෙනෙකු කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඔවුන්ගේ වැටුප් හා දීමනා ලෙස එකතුව රු. 7,188,333 ක් ගෙවා තිබුණි. | තිබූ අයදුම්කරුව ඔහු වෙත පැවරීමට අපේක්ෂා කරන රාජකාරියට උචිත වන නව තනතුරක් යටතේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත බඳවාගන්නා ලදී. | ඇත්නම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. |